රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 29/2022

මගේ අංකය:EST-6/06/TVL/3040
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2022.12. 17

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 30 වගන්තිය සංශෝධනය කිරීම

ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ XIV වැනි පරිච්ඡේදයේ 30 වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එම වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීමට 2022.11.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

**30. රජයේ නිලධරයන් නොවන පුද්ගලයන්**

නිසි බලය යටතේ කැඳවන ලද පරීක්ෂණ කොමිසමක නොහොත් මණ්ඩලයක රැස්වීම් වාරයකට, සම්මේලනයකට, කමිටුවකට හෝ දෙපාර්තමේන්තු පරීක්ෂණයකට පැමිණෙන ලෙස හෝ මෙහි 26 වගන්තියෙන් ආවරණය වී නැති යම්කිසි රාජකාරියක් නිර්වේතනික තත්ත්වයෙන් ඉටු කරන ලෙස හෝ රජයේ නිලධරයකු නොවන යම්කිසි පුද්ගලයෙකුට නියම කරනු ලැබුවහොත් ඒ වෙනුවෙන් එම පුද්ගලයා දැරූ ගමන් වියදම් මෙම සංග්‍රහයේ X වැනි පරිච්ඡේදයේ අදාළ විධිවිධානයන්ට අනුව ද, අවම සංයුක්ත දීමනා අගය මත පදනම්ව පැමිණීමේ දීමනාවක් මෙම පරිච්ඡේදයේ 4 වගන්තියේ අනෙකුත් විධිවිධානයන්ට යටත්ව ද ගෙවිය හැකිය.

03. මෙම චක්‍රලේඛ විධිවිධාන 2022.11.14 දින සිට ක්‍රියාත්මක වේ.

එම්.එම්.පී.කේ.මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන :0112-699399
ෆැක්ස් :0112-692158
විද්‍යුත් ලිපිනය :ade-vi@pubad.gov.lk